ගාලු උරුමය පදනම - 2021

--------------------------------

**01.** **මූල්‍ය ප්‍රකාශන**

---------------

**1.1** **මතය**

-------

ගාලු උරුමය පදනමේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.
ගාලු උරුමය පදනමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2.** **මතය සඳහා පදනම**

--------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, පදනම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය පදනම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ගාලු උරුමය පදනමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
ගාලු උරුමය පදනමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, පදනමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4** **විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

------------------------------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන

ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වැරදි දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුනද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් දරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් පදනමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබා ගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා පදනමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන්වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල පදනමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ගාලු උරුමය පදනමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව පදනම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

---

**1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය**

---

ගණුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගණුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබා ගැනීමට ප්‍රමාණවත් "මනා ලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

**1.5.2 නීති,රීති,රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

---

| නීති,රීති,රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41(1) වගන්තිය | විගණනය කරනු ලබන සෑම අස්ථිත්වයක් සඳහාම අවස්ථාවෝචිත පරිදි විගණන හා කළමනාකරණ කමිටු පිහිටවිය යුතු වුවද, ගාලු උරුමය පදනම විසින් 2021 වර්ෂය අවසානය දක්වා විගණන හා කළමනාකරණ කමිටුවක් පිහිටුවා ක්‍රියාත්මක කර නොතිබුණි. | විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් සඳහා පහත නිලධාරීන්ගෙන් සමන්විත කමිටු සංයුතියක් 2021 අප්‍රේල් 21 වන දින ගාලු උරුමය පදනමේ අධ්‍යක්ෂ හා සභාපති වෙත යොමු කරන ලද අභ්‍යන්තර ලිපියක් මගින් යෝජනා කර අනුමැතිය ලබා ගන්නා ලදි. | 2022 ජුනි 30 දක්වා කළමනාකරණ කමිටු පිහිටුවා තිබුණද, මෙතෙක් ක්‍රියාත්මක කර නොමැති බැවින් කමිටු පිහිටුවා ක්‍රියාත්මක කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

---

**2.1 මූල්‍ය ප්‍රතිඵලය**

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙහෙයුම් කටයුතු වල ප්‍රතිඵලය රු.584,118 ක ඌනතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.55,286 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.639,404 ක් හෙවත් සියයට 1157 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. සමාලෝචිත වර්ෂයේ රජයේ ප්‍රදාන රු.891,348 කින් අඩුවීම මෙම මූල්‍ය ප්‍රතිඵලයෙහි පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ ආකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගාලු උරුමය පදනමට වැඩි බලතල ලබා ගැනීමට හා පදනම සඳහා ආදායම් උත්පාදනය නංවාලීමේ යන අරමුණු සඳහා 1994 අංක 07 දරන ගාලු උරුමය පදනම පනත සංශෝධනය කිරීමේ අවශ්‍යතාවය හඳුනාගෙන ඒ සඳහා 2015 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල සංදේශයක් පිළියෙල කර තිබුණද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් එම පනතේ සංශෝධනයක් සිදු කර නොතිබුණි. | 2018 වර්ෂයේදී එවකට පැවති රජය විසින් ගාලු උරුමය පදනම සඳහා නව පනතක් සකස් කිරීමට අවශ්‍ය මූලික කටයුතු ආරම්භ කර තිබුණි. එහිදී දැනට පවතින පනත සංශෝධනය කිරීමක් අපේක්ෂා නොකළ අතර දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශයේ මූලිකත්වයෙන් “Southern Forts Authority Act ” ලෙස නව පනත සකස් කිරීමට කටයුතු යොදා තිබුණි.<br>නව කළමනාකරණ මණ්ඩලය එම පනතම සංශෝධනය කිරීමටත් ඒ සඳහා නව යෝජනා සකස් කිරීමටත් 2022 පෙබරවාරි 21 වන දින පැවති කළමනාකරණ මණ්ඩල කමිටු රැස්වීමේදී තීරණය වූ අතර එම යෝජනා අමාත්‍යාංශයට යොමු කර පනත සංශෝධනයට කටයුතු කරනු ලැබේ. | පනත සංශෝධනය කරවා ගැනීමට කටයුතු කළ යුතුය |
| (ආ) | ගාල්ල කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙතින් ගාලු උරුමය පදනම වෙත පවරා තිබූ රු.මිලියන 1,036.5 ක් වූ ඉඩම සහ රු.මිලියන 3.825 කට තක්සේරු කර තිබූ ගොඩනැගිල්ල මහ නගර සභා සහ බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයෙහි උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතියෙහි නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ වෙත ගාල්ල කොටු බැම්ම සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් සමාගම් වෙත තාවකාලික නවාතැන් සඳහා ගොඩනැගිල්ල වසරක කාලයක් සඳහා භාවිතා කිරීමට අවසර දී එහි කාලය දීර්ඝ කරමින් වසර 02 ½ කාලයක් තුළ කොන්ත්‍රාත් සමාගම එහි රැඳී සිටියද, කොන්ත්‍රාත් සමාගමෙන් බදු මුදලක් අයකර ගෙන නොතිබුණි. එසේම, ගොඩනැගිල්ල සංරක්ෂණය කිරීම සඳහා 2021 වර්ෂයේ වාර්ෂික අයවැය ප්‍රතිපාදන රු.මිලියන 7.85 ක් වෙන් කර ගෙන තිබුණද, අදාළ ගොඩනැගිල්ල කොන්ත්‍රාත්කරුවන් නේවාසිකව සිටි බැවින් එහි අළුත්වැඩියා කටයුතු කිරීමට පදනමට නොහැකි වී තිබුණි. | 2021 මුල් අවධියේ මෙහි සංරක්ෂණ කටයුතු ආරම්භ කිරීමට පියවර ගත් අතර, සැලසුම් අනුමත වීම ප්‍රමාද වීම, ඉංජිනේරු ඇස්තමේන්තු සකස් කිරීම සහ ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ප්‍රමාදයන් නිසා ගොඩනැගිල්ල සංරක්ෂණය එතෙක් ප්‍රමාද වුවද, වර්තමානයේ දී එහි සංරක්ෂණ කටයුතු ආරම්භ කිරීමට පියවර ගෙන ඇත. | කොන්ත්‍රාත්කරුගෙන් බදු මුදල් අයකිරීමට කටයුතු කළ යුතුය. ලබාදෙන ප්‍රාග්ධන ප්‍රතිපාදන වලින් අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘති 12 ක් සඳහා රු.මිලියන 25.8 ක ප්‍රතිපාදන අනුමත කර තිබුණු අතර ඉන් රු.මිලියන 17.55 ක ප්‍රතිපාදන පමණක් වැය කර තිබුණි. අනුමත ප්‍රතිපාදන වලින් රු.මි 12.05 ක ප්‍රතිපාදන වෙන් කරන ලද ව්‍යාපෘති 04 සඳහා රු.මිලියන 1.22 ක වියදමක් දරා තිබුණ නමුත්, එම ව්‍යාපෘති සිදු කිරීමේ අරමුණ ඉටු වී නොතිබුණි. | සංරක්ෂණ සැලසුම් අනුමැතිය ප්‍රමාදවීම, ඉංජිනේරු ඇස්තමේන්තු පිළියෙල කිරීම ප්‍රමාදවීම, ප්‍රසම්පාදන ක්‍රියාවලිය ප්‍රමාද වීම හා කොරෝනා තත්ත්වය මත විටින්විට රට අගුළු දැමීම හේතු විය. | ලබා දෙන ප්‍රතිපාදන වලින් ව්‍යාපෘතිවල අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. ඉදිකිරීම් වලට පෙර එය ඉටු කිරීමේ හැකියාව සොයා බැලිය යුතුය. |

# 4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

## 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගාලු උරුමය පදනම විසින් 2021 වර්ෂය සඳහා පිළියෙල කර තිබූ අයවැය ලේඛන අනුව වර්ෂයේ ක්‍රියාකාරකම් සඳහා ඇස්තමේන්තුගත වටිනාකම හා සත්‍ය වශයෙන් දරා තිබූ වියදම් අතර සැලකිය යුතු විචලතා පැවති අතර එම විචලනයේ ප්‍රතිශතය සියයට 66 සිට සියයට 99 ක් දක්වා විය. | පොලිස් නිළ නිවස සංරක්ෂණය ප්‍රමාද වීම, මූලික සැලසුම් අනුමත කිරීම් කටයුතු කොරෝනා වසංගතය ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාද වීම කලින් සැලසුම් කළ පරිදි කටයුතු කිරීමට නොහැකිවීම මෙකී ඉතිරියන්ට හේතු විය. | අයවැය සැකසීමේදී පවතින සම්පත් අනුව හා තිබුණු පරිදි තොරතුරු පදනම් කරගෙන හා ළඟා කරගත හැකි ඉලක්ක මත කටයුතු කළ යුතුය. |